# නැගෙනහිර පළාත් කොඩිය පිළිබඳව හැඳින්වීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධන පනතට අනුව පළාත් සභා පිහිටුවීමේදී එවක අතිගරු ජනාධිපතිතුමන්ගේ විශේෂ නියෝගයක් මත ඒකාබද්ධ කරන ලද උතුරු හා නැගෙනහිර පළාත් දෙක දශක දෙකක කාලයකින් පසුව එනම් වර්ෂ 2006 ක් වූ ඔක්තෝම්බර් මස 16 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයකට අනුව නැවත උතුරු හා නැගෙනහිර වශයෙන් පළාත් දෙකකට බෙදා වෙන් කරන ලදි.

ඒ අනුව නැගෙනහිර පළාත් ඒකීය හා ස්වෛර්භාවය මෙන්ම අනන්‍යතාවය තහවුරු කිරීම් වස් නැගෙනහිර පළාතට සුවිශේෂ වූ පළාත් ධජයක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය ඉටු කිරීමේ අරමුණින් යුතුව නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ උපදෙස් හා අදහස් මත මෙම කොඩිය නිර්මාණය කර ඇත.

මෙම කොඩියේ ප්‍රධාන සංකේත වශයෙන් යොදා ඇති රාජාලියා, මාළුවා හා සිංහ සත්ව රූප මගින් පිළිවෙලින් ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික්කයන් සඳහා දීර්ඝ කාලයක් මුළුල්ලේ භාවිතා කොට ඇති එම දිස්ත්‍රික්ක නියෝජනය කර ඇති සංකේත එලෙසින්ම යොදාගෙන ඇති අතර,

සතර කොන් වල ඇති සූර්ය රූප මගින් නැගෙනහිර පළාත පුරා විහිදී යන භූමි ප්‍රදේශයට හිරු නැගීමේ බලවත් කම විදහාපාන අයුරු සංකේතවත් කොට ඇත. කොඩියේ යොදා ඇති වර්ණ භාවිතයේදී කොඩිය පුරා කැපී පෙනෙන දුඹුරු හා කහ වර්ණ තීරු පාරම්පරික කොඩි නිර්මාණයේදී භාවිතයට ගෙන ඇති වර්ණ ඒ අයුරුන්ම සංකේතවත් කිරීම සඳහා යොදා ගෙන ඇත.

ලා නිල් පැහැයෙන් දක්වා ඇති මායිම් තීරුව නැගෙනහිර පළාතේ ප්‍රධාන ගංගා, ඇළ දොළ හා වැව් අමුණු ඇතුළු මිරිදිය ජලාශ සංකේතවත් වන අයුරින් යොදාගෙන ඇති අතර,

ඒ වටා ඇති ක්‍රමයෙන් තද නිල් පැහැ ගැන්වෙන තීරු දෙකින් නැගෙනහිර පළාතේ ප්‍රධාන දිස්ත්‍රික් තුන මායිම්ව ඇති මහා සමුද්‍ර තීරුව සංකේතවත් වන අයුරින් යොදා ගනිමින් නිර්මාණය කොට ඇත.

මෙම පළාත් ධජය 2007 මැයි මස 22 වන දින නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාර රියර් අද්මිරාල් මොහාන් විජේවික්‍රම මැතිතුමා විසින් නිල වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන වගයි.